පොදු චක්‍රලේඛ අංක: 01 - 41 /2016

මගේ අංකය: DMH/A/19/2016
සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය
අමාත්‍යාංශය
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත
කොළඹ 10.
2016.08.02.

සියලුම පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්
සියලුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
සියලුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
සියලුම ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂවරුන්
සියලුම වෛද්‍ය අධිකාරීවරුන්
සියලුම විශේෂිත ව්‍යාපාර සහ වැඩසටහන් ප්‍රධානීන්
සියලුම ආයතන ප්‍රධානීන්

## ප්‍රජාව තුළ මද්‍යසාර පාලනය පිළිබඳ ක්‍රියාවන් සවිබල ගැන්වීම

මද්‍යසාර භාවිතය යනු ලොව පුරා මහජන සෞඛ්‍ය, සංවර්ධනය හා දිළිඳු බව දුරලීම අඩාල කරවන, මිනිසුන් රෝගී කරවන එක් ප්‍රධාන සාධකයකි. මද්‍යසාර භාවිතය නිසා පුද්ගලයින්ගේ ජීවිත හා පවුල් මෙන්ම මුළු මහත් සමාජයම බිඳවැටීමට ලක්වේ.

ශ්‍රී ලංකාවේ වර්තමාන මද්‍යසාර භාවිතය පුරුෂයින් අතර 39.6% ක් වන අතර ස්ත්‍රීන් අතර 2.4 %කි (ශ්‍රී ලංකාවේ ජාතික මද්‍යසාර භාවිතය පිළිබඳ සමීක්ෂණය, 2012). ශ්‍රී ලංකාවේ සිදුවන මරණ 10ක් ගත්විට එයින් 7ක් සිදුවන්නේ බෝ නොවන රෝග නිසාවෙනි. මද්‍යසාර භාවිතය බෝනොවන රෝග ඇති කරවන ප්‍රධාන හේතු සාධක 4න් එකකි. මද්‍යසාර රටෙහි පවතින ඉහළ සියදිවි නසාගැනීමේ ප්‍රතිශතයන්වලටද ප්‍රබලව දායක වේ (අබේසිංහ ආර්, 2008). එය ගෘහස්ථ හිංසනයට හේතුකාරකයක් වන අතර, ශ්‍රී ලංකාවේ මද්‍යසාර හා දිළිඳු බව අතර ඉතාමත් සංකීර්ණ සම්බන්ධතාවක් ඇත (සුබ්‍රමනියම් සහ සිවයෝගන්, 2001; ද සිල්වා, සමරසිංහ සහ හංවැල්ල, 2011).

මද්‍යසාර භාවිතය ඉහළ යාම හේතුවෙන් ඇති වන ගැටළු ආමන්ත්‍රණය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් මද්‍යසාර පාලනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කර කඩිනමින් එළි දැක්වීමට කටයුතු යොදා ඇත.
මෙම ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට සහයෝගය දැක්වීමක් ලෙස අදාළ සියලු පාර්ශවකරුවන්ගේ සක්‍රිය දායකත්වයෙන් ඔබ ප්‍රදේශයේ/ ආයතනයේ පහත සඳහන් මද්‍යසාර නිවාරණ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙස කරුණාවෙන් දන්වා සිටිමි.

සාරාංශයක් ලෙස;

1. මද්‍යසාර පාලනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළ ව තම ප්‍රදේශවල සිදු කරන මද්‍යසාර නිවාරණ සහ පාලන ක්‍රියාකාරකම්/ වැඩසටහන් සඳහා සියලු ප.සෞ. සේ. අධ්‍යක්ෂවරුන්/ ප්‍රා. සෞ. සේ. අධ්‍යක්ෂවරුන් සහයෝගය දැක්විය යුතුය.

2. සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සහ ප්‍රජාව මද්‍යසාර නිවාරණය පිළිබඳ දැනුවත් කිරීම සඳහා මනෝ වෛද්‍ය විශේෂඥවරුන්, වෛද්‍ය නිලධාරී/මානසික සෞඛ්‍ය(කේන්ද්‍රගත), වෛද්‍ය නිලධාරී/ මානසික සෞඛ්‍ය සහ සෞ. වෛ. නිලධාරීන් එක්ව කටයුතු කළ යුතුය. මෙහිදී පාසැල්, ක්‍රීඩා

සමාජ, ප්‍රජා සංවිධාන සහ සිවිල් සමාජ වැනි අදාළ ඉලක්ක කණ්ඩායම් සඳහා ප්‍රජා වැඩසටහන් සංවිධානය කළ හැක.

3. මද්‍යසාර භාවිතා කරන්නන් පිළිබඳ ව පසුවිපරම් කිරීමට සහ ඔවුන් පුනරුත්ථාපනය කිරීම සඳහා ම වෙන්වූ එක සායනයක්වත් තම ආයතනයේ පැවැත්වීම මනෝ වෛද්‍ය විශේෂඥවරුන් ගෙන් අපේක්ෂා කෙරේ. ප්‍රදේශයේ සෞ.වෛ.නි. සහ සමාජ සේවා, තරුණ කටයුතු, සමෘද්ධි යනාදී සෞඛ්‍ය නොවන පාර්ශවකරුවන් ගේ සහයෝගය ඇතිව, වෛද්‍ය නිලධාරී/මානසික සෞඛ්‍ය හරහා මෙම සායනික සේවාවන් ප්‍රජා මට්ටමින් ද දියත් කළ යුතුය.

4. සියලුම සෞ. වෛ. නිලධාරීන් සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් විසින් මහජනයා එක්රැස්වෙන අවස්ථා, විශේෂයෙන්ම ක්‍රීඩා උත්සව සඳහා මද්‍යසාර කර්මාන්තය මගින් අනුග්‍රහය දැක්වීම තහනම් කළ යුතුය. දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනතෙහි වගන්ති කඩවීම් පිළිබඳ ව අදාළ අධිකාරිය වෙත වාර්තා කිරීමට උනන්දු කළ යුතුය.

5. අවම වශයෙන් දිස්ත්‍රික්කයකට එක මද්‍යසාර පුනරුත්ථාපන මධ්‍යස්ථානයක්වත් පිහිටුවීම මගින් මද්‍යසාර පුනරුත්ථාපන සේවා, ආයතන සහ ප්‍රජා මට්ටමින් දියත් කළ යුතුය. මද්‍යසාර භාවිතය නිසා අගතියට පත් පවුල් හඳුනාගෙන ඔවුන් උපකාරක සේවා සඳහා යොමු කිරීම ප්‍රාථමික සෞඛ්‍ය කාර්ය මණ්ඩලය වෙතින් අපේක්ෂා කෙරේ.

6. තම ප්‍රදේශයේ කිසිදු හෝටලයක්, අවන්හලක් හෝ මද්‍යසාර නිකුත් කරන ස්ථානයක් මගින් වයස අවුරුදු 21ට අඩු පුද්ගලයන්ට මද්‍යසාර අලෙවි කිරීම/ ලබා දීම සිදු නොකෙරෙන බවට සියලුම සෞ. වෛ. නිලධාරීන් සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් විසින් වගබලාගත යුතුය.

ශ්‍රී ලංකාවේ මද්‍යසාර භාවිතය නිසා සිදුවන මරණ සහ රෝගාබාධ අඩු කිරීම සහ මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීමඋදෙසා ප්‍රජාව තුළ මද්‍යසාර නිවාරණ සහ පාලන කටයුතු සඳහා ඔබගේ පූර්ණ සහයෝගය අපේක්ෂා කරමි. වැඩි විස්තර ඔබ දිස්ත්‍රික්කයේ මනෝ වෛද්‍ය විශේෂඥවරුන්ගෙන්, මානසික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ගෙන්, සෞඛ්‍ය අමාත්‍යාංශයේ මානසික සෞඛ්‍ය අධ්‍යක්ෂ කාර්යාලයෙන් **(mhusrilanka@gmail.com)** සහ දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියෙන් ලබා ගත හැක.

.............................................

වෛද්‍ය පී.ජී. මහීපාල

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

වෛද්‍ය පී. ජී. මහීපාල
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

පිටපත්:

ලේකම් / සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
සියලුම නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන්
සභාපති /දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය
අධ්‍යක්ෂ /මානසික සෞඛ්‍ය
සභාපති / ශ්‍රී ලංකා මනෝ වෛද්‍ය විශේෂඥ සංගමය